**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2021**
**-----------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මතය
-------

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම
---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිලධාරියෙකුගෙන් අයවිය යුතුව පැවති ආපදා සහ පරිගණක ණය රු.112,988 ක් වසර 05 කට අධික කාලයක සිට අය කරගෙන නොතිබුණි. | මෙම මුදල මෙතෙක් නිදහස් කර නොමැති විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල මඟින් ඉදිරියේදී පියවා ගැනීමට කටයුතු කරන බව. | අය නොවී පවතින ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා කාලයට අදාළව සිසුන් 1,794 දෙනෙකුගෙන් අයවිය යුතු රු.30,140,292 ක හිඟ පාඨමාලා ගාස්තු අය කර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂයන්හි පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් අධ්‍යයන කටයුතු නිසි පරිදි සිදු නොවීමත්, මාස කිහිපයක් රට සම්පූර්ණයෙන්ම වසා දැමීමත් තුළින් අධ්‍යයන කටයුතු සැලැසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි වූ බැවින් පාඨමාලා ගාස්තු අය කර ගැනීමේ ප්‍රමාදයක් සිදු වූ බව. | හිඟ පාඨමාලා ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 | රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 04 දෙනෙකුගෙන් ඇප තැන්පතු ලබා ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මුදල් අයකැමි හැර අනෙකුත් නිලධාරීන්ගෙන් මුදල් රෙගුලාසි 880 හි දක්වා ඇති ආකාරයට ඇප තැන්පතු ලබා ගැනීමක් සිදු නොකරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත විගණන වාර්තාව සමඟ පසුගිය වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, ඉකුත් වර්ෂයට අදාළ වාර්ෂික | 2020 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දිනයක් ලබාදී නොමැති බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

වාර්තාව 2021 දෙසැම්බර් 31 දින
වන විටද පාර්ලිමේන්තුවේ සභාගත
කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.48,875,456 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,615,105 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,260,351 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට පාඨමාලා ගාස්තු රු.54,815,342 හා විදේශ විනිමය හුවමාරු ලාභ රු.7,624,333 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බදුල්ල - මහනුවර අධිවේගී මාර්ගය තැනීමේදී සිදුවන පාරිසරික බලපෑම් පිළිබඳ ඇගැයීම් වාර්තාව සඳහා ගෙවා තිබුණු රු.6,386,200 ක් ගෙවා ඇති ආකාරය සහ එය නිසි ආකාරයෙන් වියදම් කර තිබේද යන්න ගැන පරීක්ෂණයක් කර වාර්තා කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාව විසින් නිර්දේශ කර වසරක කාලයක් ගතවී තිබුණු නමුත් මේ දක්වාම එම කාර්යයේ ප්‍රමාණවත් ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි. | 2021 දෙසැම්බර් 13 දින පත් කර තිබුණු පරීක්ෂණ මණ්ඩලයේ පරීක්ෂණ කටයුතු අවසන් කර නොමැති බව. | නියමිත කාල සීමාව තුළ විධිමත් පරීක්ෂණයක් සිදු කර පොදු ව්‍යාපාර කාරක සභාව වෙත වාර්තා කළ යුතුය. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා සඳහා සිසුන් 520 ක් ඇතුළත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණු නමුත් සිසුන් 156 ක් පමණක් ඇතුළත් කරගෙන තිබුණු අතර එය අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 30 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් පාඨමාලා සඳහා සිසුන්ගේ ලියාපදිංචි වීමේ අඩුවක් දක්නට ලැබුණු බව. | වාර්ෂික සැලැසුම් ප්‍රකාරව පාඨමාලා සඳහා අපේක්ෂිත සිසුන් ප්‍රමාණය ඇතුළත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | ආයතනය විසින් පවත්වනු ලබන දර්ශන ආචාර්ය උපාධි (Ph.D) පාඨමාලා 10 ක් සඳහා 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සිසුන් 18 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. | ශ්‍රී ලංකාවේ පර්යේෂණ උපාධි සඳහා ප්‍රතිපාදන සපයනු ලබන ජාතික විද්‍යා පදනම හා ජාතික පර්යේෂණ මධ්‍යස්ථාන විසින් 2020 හා 2021 වර්ෂ සඳහා වෙන් කළ | වාර්ෂික සැලැසුම් අනුව පාඨමාලා සඳහා අපේක්ෂිත සිසුන් ප්‍රමාණය ඇතුළත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර ඉකුත් වර්ෂයේදී එක් සිසුවෙකු පමණක් ලියාපදිංචි කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එක් ශිෂ්‍යයකු හෝ ලියාපදිංචි කර නොතිබුණි. ඊට අමතරව ඇතැම් පාඨමාලා සඳහා වසර 05 ක් මුළුල්ලේම එකදු ශිෂ්‍යයකු හෝ ලියාපදිංචි කර නොතිබුණි. | ප්‍රතිපාදන අඩු කිරීම නිසා මෙසේ සිදුවී ඇති බව. | |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ කටයුතු සඳහා ශිෂ්‍යයන්ට පහසුකම් ලබාදීම වෙනුවෙන් 2018 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අරමුදල් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දින වන විට පැවති රු.2,083,789 ක් උපයෝජනය කර නොතිබුණි. | 2018 වර්ෂය තුළ ආරම්භ කරන ලද පර්යේෂණ අරමුදල මඟින් මේ වන විට රු.5,929,600 ක් පර්යේෂණ ව්‍යාපෘති 12 ක් සඳහා ප්‍රදානය කොට ඇති බව හා රු.2,083,789 ක ශේෂය ඇතුළු තවත් මිලියන 5 කට ආසන්න පර්යේෂණ ප්‍රදාන ලබාදීම සඳහා මේ වන විටත් අයදුම්පත් කැඳවා ඇති බව. | අරමුදල් ලැබී ඇති කාර්යයන් සඳහා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.1,776,855 ක් වූ පර්යේෂණ ප්‍රදාන 05 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | පර්යේෂණ ව්‍යාපෘති සැලැසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම කෙරෙහි රට තුළ පවතින රසායනික ද්‍රව්‍ය හා තාක්ෂණික උපකරණ හිඟතාවයද බලපා ඇති බව. | -එම- |